**සජිත් ප්‍රේමදාස (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**சஜித் பிரேமதாச (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கை பாராளுமன்றம்

**Sajith Premadasa (M.P.)**
Leader of the Opposition - Parliament of Sri Lanka

**රට බංකොලොත්භාවයට පත් වීමට හේතු සොයන ව්‍යාජ චෞර කමිටුව වෙනුවට ජනතාවාදී විපක්ෂයෙන් සැබෑ විකල්ප කමිටුවක්.**

රට බංකොලොත් බාවයට පත් කරමින් පැනනැග ඇති ආර්ථික අර්බුධය නිර්මාණය වීමට හේතු සාධක සෙවීම සඳහා පාර්ලිමේන්තුවේ තේරීම්කාරකසභාවක් පත්කළ යුතු යැයි පාර්ලිමේන්තුවට ප්‍රථමයෙන් යෝජනා කරනු ලැබුවේ සමගි ජන බලවේග පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා යි.

මාස ගණනාවකට පෙරාතුව සමගි ජන බලවේගය විසින් ඉදිරිපත් කළ එකී ජනතාවාදී යෝජනාවට කිසිදු අවංක හෝ ධනාත්මක ප්‍රතිචාරයක් නොදැක්වූ කුප්‍රකට චෞරමූලික ආණ්ඩුව සුපුරුදු පරිදි චෞර සෙවනැලි බහුතරයකින් පිරිගිය තේරීම් කාරක සභාවක් තම අභිමතය පරිදි පත් කිරීමට කටයුතු කර ඇත.

ආණ්ඩුව විසින් මෙයට පෙරාතුව සමගි ජන බලවේගය විසින් ගෙන ආ විසි එක් වන ව්‍යවස්ථා සංශෝධනය, තරුණ නියෝජනය පුළුල් කිරීම හාදුෂණ විරෝධී පනත ආදී ජනහිතකාමී යෝජනා යට ගසා තම මුග්ධ දේශපාලන අරමුණු ආරක්ෂා කිරීමට ක්‍රියා කළ අයුරින්ම මෙම යෝජනාවද ආණ්ඩුව තම පටු දේශපාලන අභිප්‍රාය මුදුන් පමුණුවා ගැනීම සඳහා යොදාගැනීමට ගත් එක් කූට උපාය මාර්ගයකි.

ආණ්ඩුව විසින් යෝජනා කොට ඇති තේරීම් කාරක සභාවේ සංයුතියත් එහි සභාපති ධූරයට ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු මෙන්ම රට බංකොලොත්භාවයට පත්වනවිට බලයේ සිටි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම්වරයා පත්කිරීමත් පිළිබඳව විමසා බලන විටම ආණ්ඩුවේ නිරුවත පැහැදිලි වේ.

රට තුළ සිදු වූ ආර්ථික අපරාධයට සහ රට බංකොලොත් කිරීමට වගඋත්තරකරුවන් වූ පිරිසම ඒ සඳහා වූ හේතුසාධක සෙවීමට පත් කිරීම යනු ජනවහර අනුව නම් සොරාගේ අම්මාගෙන් පේන ඇසීමක් බඳුය. මෙම තේරීම් කාරක සභාවේ මුඛ්‍ය අරමුණ වනුයේ රට බංකොලොත් කිරීමට මුල්වූ පිරිස නිදොස් කොට නිදහස් කිරීම බව ඉතාමත් පැහැදිලිය. එවන් තේරීම් කාරක සභාවක කටයුතු කිරීම කාලය කා දමන නිරර්ථක ක්‍රියාවක් මෙන්ම රට බන්කොලොත් භාවයෙන් පිඩාවට පත් සමස්ත ශ්‍රී ලාංකික ජනතාවට කරන ද්‍රෝහී ක්‍රියාවකි.

කරුණු මෙසේ හෙයින් සමගි ජන බලවේගය මෙම තේරීම් කාරක සභාවෙන් ඉවත් වීමට තීරණය කරන ලදී.

තවද වගකිව යුතු විපක්ෂයක් ලෙස පාර්ලිමේන්තුවේ විපක්ෂ පක්ෂ එකමුතුවේ විධායක කමිටුවේ තීරණය අනුව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් රටේ ආර්ථික අර්බුදයට හේතු වූ කාරණා සහ එයට වගකිවයුත්තන් පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත් කිරීමට තීරණය කරන ලදී.

විපක්ෂය විසින් පත්කරන ලද මෙම කමිටුව ආර්ථික විනාශයට වගකිවයුතු සියලු පාර්ශ්වයන් පිළිබඳව විධිමත්ව සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරනු ඇත. මෙම කමිටුවේ ක්‍රියාකාරීත්වය උදෙසා පාර්ලිමේන්තුවේ සෑම මන්ත්‍රීවරයෙකුටම සිය සද්බාවයෙන් යුතු දායකත්වය සහ සහාය ලබාදිය හැකි අතර මෙම කමිටුව විසින් මේ සඳහා තොරතුරු ලබා ගත යුතු සෑම පාර්ශ්වයකින් ම තොරතුරු ලබාගැනීමට කටයුතු කරනු ඇත. එමෙන්ම ඒ පිළිබඳව තොරතුරු ලබාදිය හැකි ඕනෑම අයෙකුට තොරතුරු ලබාදීමට අවශ්‍ය විධිවිධාන සලසනු ඇත.

දුරකතන : / தொலைபேசி : / Telephone : 011 2 777 253, 011 2 699 171
ෆැක්ස් : / தொலைநகல் : / Fax : 011 2 699 174
විද්‍යුත් තැපෑල : / மின்னஞ்சல் : / Email : sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7
இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7
No 30, Sir Marcus Fernando Mawatha Colombo 7

විපක්ෂය විසින් පත් කරනු ලබන මෙම කමිටුව තුළින් පාරදෘශ්‍යභාවයකින්, වගවීමකින් සහ වගකීමකින් යුතුව රට බංකොලොත් භාවයට පත්කළ පුද්ගලයින් හඳුනා ගැනීමටත්, ඔවුන් විසින් සිදුකළ වංචා හා දූෂණයන් තුළින් සහ ගන්නා ලද අත්තනෝමතික වැරදි තීරණ තුළින් රටට අහිමිවී ගිය මහජන ධනය හා දේපල ප්‍රමාණය කොපමණද යන්න පිළිබඳව නිවැරදි තක්සේරුවක් ලබා ගැනීමටත්, එම අහිමිවී ගිය මහජන ධනය සහ ජාතික සම්පත් නැවත ලබාගැනීමට අවශ්‍ය පියවර නිර්දේශ කිරීමටත් සහ වගවීම සහ වගකීම පැහැර හැර ඇති සියලු දෙනාට එරෙහිව ගතයුතු සුදුසුම නීතිමය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමටත් අපේක්ෂා කරමි.



**සජිත් ප්‍රේමදාස**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක


දුරකතන : தொலைபேசி : Telephone : 011 2 777 253 / 011 2 699 171

ෆැක්ස් : தொலைநகல் : Fax : 011 2 699 174

විද්‍යුත් තැපෑල : மின்னஞ்சல் : Email : sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7
இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7
No 30, Sir Marcus Fernando Mawatha Colombo 7